# සත්ව පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
## පළමු කණ්ඩායම (2022-2024)
## පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය
## පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය
## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන සත්ව පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**
පහත සඳහන් සුදුසුකම්වලින් අවම වශයෙන් එකක් හෝ සපුරන ලද සත්ව පාලන ක්ෂේත්‍රයේ සේවා නියුක්තිකයන් හෝ සත්ව පාලන ව්‍යවසායකයන් හෝ සත්ව පාලනය සම්බන්ධ තමාගේම ව්‍යාපාරයක් ඇරඹීමට අපේක්ෂා කරන පුද්ගලයන් හට මේ සඳහා අයදුම් කළ හැකිය.

1. ඕනෑම විෂය ධාරාවකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිට එකවර විෂයන් සියල්ල සමත්ව, ඉන් පසුව සත්ව පාලන ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක සේවා කාලයක් සපුරා තිබීම
හෝ
වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය විසින් පිරිනමන සත්ව පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාව සම්පූර්ණ කර හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමක් (SLQF-III හෝ NVQL-V) සපුරා තිබීම.
2. ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලය මඟින් නිර්දේශ කරන සහ සනාතන සභාවේ අනුමැතිය ලබන සුදුසුකම්.

**බඳවා ගැනීමේ පටිපාටිය**
ඇතුළත්වීමේ සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන් සත්ව පාලනය පිළිබඳ මූලික සිද්ධාන්ත ඇතුළත් ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට (සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන්) ඉදිරිපත් විය යුතු ය. ඒ සඳහා අවම වශයෙන් ලකුණු 40ක් ලබාගන්නා අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවේ. ඉහත පරීක්ෂණ වලින් සමත්වන අපේක්ෂකයින් පාඨමාලාව හැදෑරීම සඳහා බඳවා ගනු ලැබේ.

**පාඨමාලා අධ්‍යයන කාලයඃ** අධ්‍යයන වර්ෂ දෙකකි (02).

**පාඨමාලා මාධ්‍යයඃ** පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන අතර දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සති අන්ත දින වල දී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පිහිටි පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශයේ දී පැවැත්වේ.

**පාඨමාලා ගාස්තුඃ** රු. 180,000/- කි (සමාන වාරික දෙකකින් ගෙවිය යුතු ය. පළමු වාරිකය ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු ය. මීට අමතරව රු.5,000/- ක ලියාපදිංචි වීමේ ගාස්තුවක් ගෙවිය යුතු ය).

**පාඨමාලා ආරම්භයඃ** 2022 මැයි

අයදුම්පත්‍ර වයඹ විශ්වවිද්‍යාලයෙහි නිල වෙබ් අඩවිය වන www.wyb.ac.lk (Announcements) වෙත පිවිසීමෙන් ලබාගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යාපන සුදුසුකම් සහතික කිරීම සඳහා වූ, අදාළ සහතිකවල පිටපත් සහ රැකියාව තහවුරු කිරීමට අදාළ අනෙකුත් ලිපි ලේඛන වල (පත්වීමේ ලිපිය සහ EPF/ETF අංක සහිත වැටුප් පත්‍රිකාව) පිටපත් සහිතව අයදුම්පත්‍ර ගාස්තුව ලෙස මහජන බැංකුවේ මාකඳුර ශාඛාවේ 137-1001-3-0041538 අංක දරණ ගිණුමට රු. 1,000/- ක මුදලක් බැරකරන ලද රිසිට් පත සමඟ කවරයේ වම් පස ඉහළ කෙළවරේ පාඨමාලාවේ නම සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් **2022 මාර්තු 01** වන දිනට පෙර **සහකාර ලේඛකාධිකාරී, පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල (වයඹ)** යන ලිපිනයට එවිය යුතු ය. අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
කුලියාපිටිය